සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமூர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/02B/රාජකාරී පැවරීම

ඔබේ අංකය / உமது இல / Your No: .....

දිනය / திகதி / Date: 2022.09.29

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්
බැංකු සමිති කළමණාකරුවන් වෙත.

**<u>තොරතුරු තාක්ෂණ ඒකක පිහිටුවීම හා A+ සහතික පත්‍ර පාඨමාලාව හදාරා තොරතුරු තාක්ෂණ නිලධාරීන් ලෙස සේවය කරන සමෘද්ධි කළමණාකරුවන් හා
සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හට තොරතුරු තාක්ෂණ නිලධාරීන් ලෙස රාජකාරී පැවරීම.</u>**

තොරතුරු තාක්ෂණ අංශය මඟින් දිවයිනම ආවරණය වන පරිදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මෘදුකාංග කිහිපයක් හඳුන්වා දී ඇත. මෙම මෘදුකාංග අතුරින් සමෘද්ධි බැංකු හා බැංකු සමිති සඳහා හඳුන්වා දී ඇති බැංකු මෘදුකාංගය (E-Banking), සමෘද්ධි සහනාධාර හා සමාජ ආරක්ෂණ ගෙවීම් හා ජීවනෝපාය ව්‍යාපෘති කළමණාකරනය වෙනුවෙන් හඳුන්වා දී ඇති මෘදුකාංගය (CRM), මානව සම්පත් කළමණාකරන මොඩියුලය (HRM)ප්‍රධාන වේ.

02. මෙම මෘදුකාංග හරහා බොහොමයක් මැනුවල්(Manual) ක්‍රියාවලීන් පරිගණක ගත කර ඇති අතර යාවත්කාලීනව අඛණ්ඩව ක්‍රියාත්මක වේ. ඒ අනුව මෙම මෘදුකාංගවල සාර්ථකත්වය සඳහා ඩිජිටල් යටිතල පහසුකම් නිසියාකාරව දිවයින පුරා විසිරී ඇති සියළුම සේවා ස්ථාන වල (සමෘද්ධි බැංකු, බැංකු සමිති, මූලස්ථාන කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල ඇතුළුව) අඛණ්ඩව ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍යය.

03. ඒ අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ තොරතුරු තාක්ෂණ කටයුතු වඩාත් විධිමත් හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය යටතේ දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය තොරතුරු තාක්ෂණ ඒකක ස්ථාපිත කිරීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ.මෙය දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ ඒකකය සහ ප්‍රජාමූල බැංකු සමිති එකක් හෝ කීපයක් ඒකාබද්ධකොට සකස් කරනලද ප්‍රාදේශීය තොරතුරු තාක්ෂණ ඒකක ලෙස පිහිටවනු ලැබේ.මෙම කාර්යාල සඳහා අවශ්‍ය භෞතික පහසුකම් අනුක්‍රමිකව ලබාදීමට සැලසුම් කර ඇත

04.නිලධාරීන් අනුයුක්ත කිරීම
මේවනවිටත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා කළමණාකරුවන් අතුරින් තොරතුරු තාක්ෂණය කෙරෙහි දැනුම හා හැකියාව ඇති තොරතුරු තාක්ෂණ රාජකාරී සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද නිලධාරීන් තෝරා ගෙන ඇත. එම නිළධාරීන්ට පරිගණක තාක්ෂණයට අදාල A+ සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා දී අවශ්‍ය පුහුනුව ලබාදීඇති අතර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ලබාදෙන NVQ Level 4 මට්ටම ලබාගැනීම සඳහාද කටයුතු සලසා ඇත.එම නිලධාරීන් අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා දැනට දරන රාජකාරිවලින් නිදහස් කර දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රාදේශීය තොරතුරු තාක්ෂණ ඒකක හා දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්ත කිරීමට කටයුතු කලයුතුය.

05. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වන බැංකු මෘදුකාංගය (E-Banking), සමෘද්ධි සහනාධාර හා සමාජ ආරක්ෂණ ගෙවීම් හා ජීවනෝපාය ව්‍යාපෘති කළමණාකරනය වෙනුවෙන් හඳුන්වා දී ඇති මෘදුකාංගය (CRM), මානව සම්පත් කළමණාකරන මොඩියුලය (HRM) ආදී මෘදුකාංගයන් හා දෙපාර්තමේන්තුවේ කටයුතු පහසුකරගැනීම සඳහා වරින්වර හඳන්වාදෙන මෘදුකාංගයන් යාවත්කාලීනව පවත්වාගෙනයාම සඳහා සමෘද්ධි බැංකු බැංකු සමිති ප්‍රාදේශීය ලේකම් කාර්යාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට අවශ්‍ය ඩිජිටල් යටිතල පහසුකම් අඛන්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම හා සම්බන්ධීකරන කටයුතු සිදුකිරීම මෙම නිලධාරීන් ගේ ප්‍රධාන රාජකාරිය වේ

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2872202
Fax - 011-2889002
E-mail- dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director (Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
0112872202
Hot Line: 011- 2887722

06. බැංකු මෘදුකාංගය වැනි සංකීර්ණ මෘදුකාංග භාවිතය පිළිබඳ අනෙකුත් නිලධාරීන් පුහුණු කිරීම සහය ලබා දීම, දෘඩාංග හා අන්තර්ජාල පහසුකම් නිසි ලෙස පවත්වා ගැනීම සහ තොරතුරු තාක්ෂණ විෂය සම්බන්ධව ඉහත දැක්වෙන ආයතනවල කාලීනව ඇතිවන අවශ්‍යතාවලදී අවශ්‍ය සහාය ලබාදීමත් අදාල ආයතන සහ ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය සමග මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමත් මෙම නිලධාරීන්ගේ රාජකාරියට අයත්ය.

07. මෙම තොරතුරු තාක්ෂණ විෂයභාර නිලධාරීන් වෙනත් රාජකාරී සඳහා අනුයුක්ත කිරීමේ දී ඒ සඳහා ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

08. ඒ අනුව එම නිලධාරීන් සඳහා වන නියමිත වගකීම් හා කාර්යය භාරයන් සහිත රාජකාරී පැවරීමේ ලිපිය මේ සමඟ එවන අතර, එය නිසි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

09. මේවනවිට බැංකු කළමණාකරන මණ්ඩලය අනුමත කරඇති සමෘද්ධි බැංකු ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා හඳුන්වාදෙන ජංගම යෙදවුම් ද (Mobile app) මෙම නිලධාරීන් මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය උපදෙස් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

10. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහය අගය කොට සලකමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

පිටපත්:-

1. ලේකම් - කාන්තා,ළමාකටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.පි.
2. ප්‍රධාන ගණකාධිකාරී - ස.ස.දෙ. - කා. දැ. පි.
3. අභ්‍යන්තර විගණක - ස.ස.දෙ. - කා.දැ.පි.
4. සියළුම අංශප්‍රධානීන් - ස.ස.දෙ. - කා.දැ.පි.